මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2023.09.15 |

**මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ශ්‍රී ලංකා සංචාරය - අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සූදානම් වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සහ වැඩමුළුව (2023 සැප්තැම්බර් 6 සිට 8 දක්වා)**

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව සම්බන්ධයෙන් ඉදිරියේදී පැවැත්වීමට නියමිත අන්‍යෝන්‍ය ඇගයීම පිළිබඳව මෙරට දේශීය බලධාරීන් තවදුරටත් දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයේ ආරාධනයකට අනුව, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ඉහළ පෙළේ නියෝජිත පිරිසක් පසුගියදා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූහ.

- ජූලියන් බ්‍රාසෝ මහතා: මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සම සභාපති සහ කැනඩාවේ ඔටාවා හි මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රතිපත්ති අංශයේ සහකාර නියෝජ්‍ය අමාත්‍ය
- ආචාර්ය ගෝර්ඩන් හුක්: මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ විධායක ලේකම්
- ඩේවිඩ් ෂැනන් මහතා: මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ අන්‍යෝන්‍ය ඇගයීම් තත්ත්ව සහ අනුකූලතාව පිළිබඳ අධ්‍යක්ෂ

මෙම ජාත්‍යන්තර නියෝජිත පිරිසට ඇතුළත් වූහ.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම යනු මූල්‍ය කාර්ය සාධක බලකායේ ප්‍රධාන කලාපීය අධීක්ෂණ ආයතනයක් වන අතර, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි ව්‍යාප්තිය සඳහා වන මූල්‍යනය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාමාජික රටවල් අධීක්ෂණය කිරීමට සහ මග පෙන්වීමට එය කැපවී සිටී. ආසන්න වශයෙන් රටවල් 200 ක් පමණ මූල්‍ය කාර්ය සාධක බලකායේ විෂය පථය යටතේ ඇති කලාපීය ආයතන නවය හා අනුබද්ධව ක්‍රියා කරයි. ශ්‍රී ලංකාව, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ආරම්භක සාමාජික රටවල් 13 න් එකක් ලෙස 1997 වසරේ සිට කටයුතු කරයි.

මූල්‍ය කාර්ය සාධක බලකාය, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි ගෝලීය මුරකරු ලෙස ක්‍රියා කරන අතර, එම නීතිවිරෝධී ක්‍රියාකාරකම් සහ එමගින් සමාජයට සිදුවන හානි වැළැක්වීමේ අරමුණින් ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් සකස් කරයි. සාමාජික රටවල් විසින් මෙම ප්‍රමිතීන් පිළිපැදීම අපේක්ෂා කෙරෙන අතර, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් පහත සඳහන් ප්‍රධාන මානයන් දෙක ආවරණය වන ලෙස විස්තීර්ණ ඇගයීම් ක්‍රමවේදයක් මත පදනම්ව සාමාජික රටවල කාර්ය සාධනය තක්සේරු කරයි:

1. තාක්ෂණික අනුකූලතාව: නෛතික සහ ආයතනික රාමුව මෙන්ම නිසි බලධාරීන්ගේ අධිකාරිය සහ ක්‍රියා පටිපාටි ඇගයීමට ලක් කරයි.
2. සඵලතා ඇගයීම: නෛතික සහ ආයතනික රාමුව මගින් අපේක්ෂිත ප්‍රතිඵල සැලසෙන ප්‍රමාණය මැන බලයි.

පිළිවෙලින් 2011 සහ 2017 වසරවලදී මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුවේ උපායමාර්ගික දුර්වලතා සහිත රටක් ලෙස දෙවරක් "අළු ලේඛනගත" කරන ලදී. 2017 වසරේ අළු ලේඛනගත කිරීමත් සමග, මෙම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් යුරෝපා සංගමය ද ශ්‍රී ලංකාව "කළු ලේඛනගත" කරන ලදී. 2019 වසරේදී නෛතික සහ ආයතනික රාමුවේ ඇති දුර්වලතා මගහරවා ගැනීමට ශ්‍රී ලංකාව විසින් කටයුතු කිරීමෙන් පසු අළු ලේඛනයෙන් ඉවත් වීමට හැකි විය.

ශ්‍රී ලංකාවේ තෙවන අන්‍යෝන්‍ය ඇගයීම සති 76කින් (2025 මාර්තු මස) පැවැත්වීමට නියමිතය. සාමාජික රටක් වශයෙන්, ශ්‍රී ලංකාව මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 40 සඳහා තාක්ෂණික අනුකූලතාවක් ලබා ගැනීම සහ අපගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව මූල්‍ය කාර්ය සාධක බලකායේ අපේක්ෂිත ප්‍රතිඵල 11 ලබා දෙන බවට සහතික වීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා, රට තුළ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කටයුතුවල සක්‍රීයව නියැලී සිටින පාර්ශ්වකරුවෝ 24 දෙනෙක් සිටිති. මේ ආශ්‍රිත සම්බන්ධීකරණ කේන්ද්‍රස්ථානය ලෙස මූල්‍ය බුද්ධි ඒකකය කටයුතු කරන අතර, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුවේ හඳුනාගත් දුර්වලතාවලට විසඳුම් සෙවීම අරමුණු කරගත් පාර්ශ්වකරුවන් විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරී සැලසුම් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.

මෙම තෙදින සංචාරයේදී, දූත පිරිස අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍ර විනිශ්චයකාරතුමා හා ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවරුන්, විදේශ අමාත්‍යතුමා, නීතිපතිතුමා සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති/මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, නීතිය ක්‍රියාත්මකකිරීමේ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු ඉහළ පෙළේ නිලධාරීන් මෙන්ම, පුද්ගලික අංශය සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් හමු වූහ.

එළඹෙන අන්‍යෝන්‍ය ඇගයීමේ වැදගත්කම පිළිබඳව ශ්‍රී ලංකාවේ ඉහළම නායකත්වයට ඉහළ අවබෝධයක් පවතින බවත්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පද්ධතියේ ස්ථාවරභාවය පිළිබිඹු කරන ඵලදායී ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා සියලු පාර්ශ්වකරුවන්ගේ කැපවීම අත්‍යවශ්‍ය බවත් නියෝජිත පිරිස නිරීක්ෂණය කළහ. ලාභය මත පදනම් වූ අපරාධ, ත්‍රස්තවාදය සහ සමූල ඝාතක අවි සඳහා මූල්‍යනය යන කරුණු වලින් අපගේ ආර්ථිකය සහ සමාජය ආරක්ෂා කිරීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකායේ ප්‍රමිතීන් ඉහළ සඵලතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

ත්‍රස්තවාදය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම, මත්ද්‍රව්‍ය ජාවාරම, දූෂණය, වෙළඳාම ආශ්‍රිත අපරාධ, සහ මුදල් විශුද්ධිකරණය ඇතුළු ලාභය මත පදනම් වූ අපරාධමය ක්‍රියාකාරකම් හේතුවෙන් මෙරට මුහුණපාන දැඩි බලපෑම් පිළිබඳව ශ්‍රී ලංකාව හොඳින් දැනුවත් වී සිටී. අන්‍යෝන්‍ය ඇගයීම සඳහා සාර්ථකව සූදානම් වීමට සහ මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අළු ලේඛනගත කිරීම හේතුවෙන් ඇතිවිය හැකි අහිතකර ආර්ථික ප්‍රතිවිපාක වළක්වා ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය දීම අතිශයින් වැදගත් වේ:

1. **සඵලතාව කෙරෙහි අවධානය යොමු කිරීම:** ශ්‍රී ලංකාවේ විශේෂිත අවදානම් සඳහා ඵලදායී ලෙස විසඳුම් ලබාදෙන මෙහෙයුම් ප්‍රතිඵල අත්කර ගැනීමට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පද්ධතියට ඇති හැකියාව අවධාරණය කිරීම.
2. **වැඩිදියුණු කළ අධීක්ෂණය:** ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වල ප්‍රගතියට සහය වීමට සහ සඵලතාවට බලපාන බාධාවන් ජය ගැනීමට පාර්ශ්වකරුවන් විසින් ප්‍රගතිය සහ මෙහෙයුම් ප්‍රතිඵල අධීක්ෂණය තීව්‍ර කළ යුතුය.
3. **කාලෝචිත නීති සම්පාදනය:** මෙහෙයුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මෙවලම් පැවතීම සහතික කිරීම සඳහා තීරණාත්මක මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ නීති සම්මත කිරීම කඩිනම් කිරීම.
4. **සම්පත් වෙන් කිරීම:** මෙහෙයුම් ප්‍රතිඵල කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සැලසීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු ආයතන වෙත ප්‍රමුඛතා පදනම මත ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම.
5. **අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය:** ක්‍රියාත්මක කිරීමේ සැලසුම්වලට අනුකූලව ඉලක්කගත සැලසුම්කරණය සහ ප්‍රගති අධීක්ෂණය සඳහා ඵලදායී නායකත්වයක් හරහා අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය පවත්වා ගැනීම.
6. **නඩු පැවරීම:** මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් නඩු පැවරීමේ බලධාරීන්ගේ හැකියාව සහ ක්‍රියාකාරී මැදිහත්වීම වැඩිදියුණු කිරීම.
7. **නීතිය බලාත්මක කිරීම:** විශේෂයෙන්, අතපසු වූ මුදල් විශුද්ධිකරණය පිළිබඳ විමර්ශන කඩිනමින් අවසන් කිරීම සහ වත්කම් ප්‍රතිසාධනය හා මුදල් විශුද්ධිකරණය සම්බන්ධ ක්‍රියාකාරකම්වල විෂය පථය පුළුල් කිරීම මගින් නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම.
8. **අධිකරණය:** මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ නඩු සම්බන්ධයෙන් අප්‍රමාදව ඵලදායී විනිශ්චයන් ලබාදීම සඳහා අධිකරණයේ හැකියාවන් වැඩිදියුණු කිරීම.

9. **පුද්ගලික අංශයේ සහභාගීත්වය:** මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පද්ධතියේ ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා වන හවුල් අභිමතාර්ථ රජය සමඟ සපුරා ගැනීම සඳහා පුද්ගලික අංශයේ ක්‍රියාකාරී මැදිහත්වීම දිරිමත් කිරීම.

10. **ජාත්‍යන්තර සහයෝගීතාව:** ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම, ඒ පිළිබඳව අවධානය යොමු කිරීම සහ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ප්‍රධාන අවදානම් බෙදාගන්නා රටවල් සමඟ අදාළ සියලු ආයතන ගැඹුරු සහයෝගීතාවයක් ඇති කර ගැනීම.

මෙම ප්‍රමුඛතා ක්‍රියාමාර්ගවලට කාර්යක්ෂමව අනුගත වීම මගින්, ශ්‍රී ලංකාවට සිය අන්‍යෝන්‍ය ඇගයීමේදී හිතකර ප්‍රතිඵලයක් ලබා ගත හැකි වනු ඇති අතර, මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අළු ලේඛනගත කිරීම හා සම්බන්ධ අහිතකර ආර්ථික හා මූල්‍ය ප්‍රතිවිපාක වළක්වා ගත හැකි වනු ඇත. එබැවින්, මෙරට තෙවන අන්‍යෝන්‍ය ඇගයීමට මුහුණ දීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුවේ ඇති දුර්වලතා අප්‍රමාදව ආමන්ත්‍රණය කිරීම සඳහා පාර්ශ්වකරුවන් 24 දෙනා විසින්ම ඔවුන්ගේ ධාරිතාව තුළ හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇති බව සහතික කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.



***වමේ සිට දකුණට අසුන් ගෙන:*** ආචාර්ය ගෝර්ඩන් හුක්, විධායක ලේකම්/මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම, ආචාර්ය නන්දලාල් වීරසිංහ, ශ්‍රී ලංකා මහ බැංකු අධිපති/මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සභාපති, ජූලියන් බ්‍රාසෝ මහතා, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සම සභාපති සහ කැනඩාවේ ඔටාවා හි මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රතිපත්ති අංශයේ සහකාර නියෝජ්‍ය අමාත්‍ය, ඩේවිඩ් ෂැනන් මහතා, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ අන්‍යෝන්‍ය ඇගයීම් තත්ත්ව සහ අනුකූලතාව පිළිබඳ අධ්‍යක්ෂ



***වමේ සිට දකුණට:*** ආචාර්ය අයේෂ් ආරියසිංහ, අතිරේක අධ්‍යක්ෂ/මූල්‍ය බුද්ධි ඒකකය, නෙලුමනී දවුලගල මහත්මිය, නියෝජ්‍ය අධිපති/ශ්‍රී ලංකා මහ බැංකුව, ඩිලාන් සිරිවර්ධන මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ/මූල්‍ය බුද්ධි ඒකකය, ඩේවිඩ් ෂැනන් මහතා, අධ්‍යක්ෂ අන්‍යොන්‍ය ඇගයීම්/මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම, ජූලියන් බ්‍රාසෝ මහතා, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ සම සභාපති සහ කැනඩාවේ ඔටාවා හි මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රතිපත්ති අංශයේ සහකාර නියෝජ්‍ය අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ මහතා, අතිගරු ජනාධිපති, ආචාර්ය ගෝර්ඩන් හුක්, විධායක ලේකම්/මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම, අධ්‍යක්ෂ එනෝකා මොහොට්ටි මහත්මිය, අධ්‍යක්ෂ/මූල්‍ය බුද්ධි ඒකකය, ආචාර්ය සුභානි කීර්තිරත්න, අතිරේක අධ්‍යක්ෂ/මූල්‍ය බුද්ධි ඒකකය සහ වංගීෂා කරුණාරත්න මෙනවිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ/මූල්‍ය බුද්ධි ඒකකය